# ප්‍රජා මාධ්‍ය භාවිතය පිළිබඳ විශ්වීය පර්යාලෝක
## (නවසිලන්තයේ මෞරි රූපවාහිනිය හා රේඩියෝ දඹාන ඇසුරින් කරන අධ්‍යයනයක්)

සුගත් සමරවීර රත්නායක
කතිකාචාර්ය, විදේශ භාෂා පීඨය, යුන්නාන් විශ්වවිද්‍යාලය, චීනය
sugathsamaraweera@yahoo.com

## සාර සංක්ෂේපය

රටක සංවර්ධන ක්‍රියාදාමයේදී ජනතාව බලගැන්වීමට ප්‍රජා මාධ්‍යයන්ට මහඟු කාර්යභාරයක් ඉටු කළ හැක. ප්‍රධාන ධාරාවේ මාධ්‍යයන්ට සාපේක්ෂව ප්‍රජා මාධ්‍යයන්ගෙන් ජන ජීවිතයට කළ හැකි බලපෑම ප්‍රබලය. මෙහි ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන ප්‍රජා මාධ්‍ය පිළිබඳ විශ්වීය පර්යාලෝක මොනවා ද යන්න පිළිබඳව අධ්‍යයනය කෙරිණ. "ප්‍රජා මාධ්‍ය භාවිතය පිළිබඳ විශ්වීය පර්යාලෝක කවරේද? ඒවා ශ්‍රී ලංකාවට පූර්වාදර්ශ කොටගත හැකිද?" යන්න මෙම පර්යේෂණයේ ගැටළුවයි. ශ්‍රී ලංකාවේ ප්‍රජා මාධ්‍ය භාවිතයේ ඌනතා, නවසිලන්තයේ මෞරි රූපවාහිනී නාලිකාව හා එහි සමාජ සම්බන්ධතා, ශ්‍රී ලංකාවේ ප්‍රජා ගුවන් විදුලි හා වැදි සමාජයේ මාධ්‍ය භාවිතය, තෝරාගත් රටවල් කිහිපයක ප්‍රජා මාධ්‍ය භාවිතය, ලෝකයේ ආදිවාසී රූපවාහිනී සේවා හා ප්‍රජා මාධ්‍ය සමාජ සංවර්ධනය උදෙසා භාවිත කළ හැකි ආකාරය යනාදිය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කළේය. ඒ තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රජා සමාජ සංවර්ධන මාධ්‍ය භාවිතය දෙස විශ්වීය මානයන්ගෙන් බැලීමට පර්යාලෝක හඳුනා ගන්නා ලදී. "සමකාලීන ප්‍රජා සමාජ සංවර්ධනය උදෙසා විශ්වීය පර්යාලෝක වැදගත් වේ. ශ්‍රී ලංකාවට පූර්වාදර්ශ කොටගත හැකියි" යන්න මෙම පර්යේෂණයේ උපකල්පනයයි. මෙහි පර්යේෂණ ක්ෂේත්‍රය වූයේ නවසිලන්තයේ මෞරි ප්‍රජාවගේ මාධ්‍ය භාවිතය සහ ශ්‍රී ලංකාවේ වැදි ප්‍රජාවේ මාධ්‍ය භාවිතයයි. ඒ සඳහා නවසිලන්තයේ මෞරි රූපවාහිනී නාලිකාවත්, ශ්‍රී ලංකාවේ රේඩියෝ දඹානත් තෝරා ගනු ලැබීය. මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නමාලා, සම්මුඛ සාකච්ඡා හා අන්තර්ගත විශ්ලේෂණය යන ක්‍රමවේදයන්ගෙන් අවශ්‍ය දත්ත සම්පාදනය කර ගත්තේය. ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් විවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රජා මාධ්‍ය භාවිත කරයි. ඒ තුළින් හඬක් නොමැති කණ්ඩායම්වල හඬ අවදි කරමින් ඔවුන් සවිබල ගැන්වීමට පුළුල් කාර්යභාරයක් ඉටුකර ඇත. ලෝකයේ සමහර ප්‍රජා මාධ්‍ය අති සාර්ථකව ක්‍රියාත්මක අතර ඇතැම් ප්‍රජා මාධ්‍ය මූල්‍ය දුෂ්කරතා, ව්‍යුහාත්මක දුර්වලතා හා දේශපාලන බලපෑම් යනාදිය හේතුවෙන් අසාර්ථක වී ඇත. මේ අනුව ප්‍රජා මාධ්‍යයක ක්‍රියාත්මක ස්වභාවය මත එහි සාර්ථක අසාර්ථක බව තීරණය වනු ඇත. ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පළමුවරට ප්‍රජා ගුවන් විදුලි සේවාවක් ආරම්භ කළ රටයි. ග්‍රාමීය ප්‍රජාව බලවන්ත කිරීමට විවිධ කාලවකවානුවල මෙරට ප්‍රජා ගුවන් විදුලි සේවාන් කටයුතු කර ඇත. නමුත් ප්‍රජා රූපවාහිනී පිළිබඳව ලාංකික සමාජය තුළ තවමත් කතිකාවක්වත් ආරම්භ වී නොමැත. ඩිජිටල් යුගයක වෙසෙන, සමාජ මාධ්‍ය පුළුල් ලෙස ව්‍යාප්තව ඇති මෙවැනි යුගයක ලෝකයේ බොහෝ රටවල් ප්‍රජා මාධ්‍ය තුළින් ද සිය සන්නිවේදන අරමුණු සාර්ථකව ඉටුකර ගනී. "සමකාලීන ප්‍රජා සමාජ සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවට ද එවැනි විශ්වීය පර්යාලෝක පූර්වාදර්ශ කොටගත හැකියි" යන්න මෙම පර්යේෂණයේ නිගමනයයි.

**මුඛ්‍ය පද :** ප්‍රජා මාධ්‍ය, රේඩියෝ දඹාන,මෞරි රූපවාහිනිය, ප්‍රජාව, සංවර්ධනය